දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

DISTANCE AND CONTINUING EDUCATION UNIT - UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ද්විතීය භාග (බාහිර) පරීක්ෂණය - 2013 මාර්තු

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) PART II - MARCH 2013

# දේවිසා 3.1 - තුලනාත්මක දේශපාලනය

# PSG 3.1 - Comparative Politics

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.)

---

01. තුලනාත්මක දේශපාලනය නිර්වචනය කොට දේශපාලනය තුලනාත්මකව හැදෑරීමේ ඇති වාසි පෙන්වා දෙන්න.

(ලකුණු 20 යි)

02. තුලනාත්මක දේශපාලන විද්‍යාවේ මුල්කාලීන සංවර්ධනයට ප්ලේටෝ සහ ඇරිස්ටෝටල්ගෙන් ලද දායකත්වය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද?

(ලකුණු 20 යි)

03. (i) a) ප්‍රජාතන්ත්‍රවාදය නිර්වචනය කරන්න.
   b) ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණ මොනවා ද?

(ලකුණු 10 යි)

(ii) ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය උදෙසා පැවැතිය යුතු මූලික කොන්දේසි මොනවාදැයි නූතන දේශපාලන ක්‍රමවල ක්‍රියාකාරිත්වය කෙරෙහි අවධානය යොමු කරමින් පෙන්වා දෙන්න.

(ලකුණු 10 යි)

04. (i) නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයන්හි ව්‍යවස්ථාදායකයේ කාර්ය භාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 10 යි)

(ii) "ව්‍යවස්ථාදායකයේ බලතල විධායකය විසින් පැහැර ගනිමින් පවතී" යන මතය ප්‍රායෝගිකත්වය කෙරෙහි අවධානය යොමු කරමින් නූතන ආණ්ඩු ක්‍රමයන් ආශ්‍රිතව විභාග කරන්න.

(ලකුණු 10 යි)

05. දේශපාලන සමාජානුයෝජනය (Political Socialization) යනු කුමක් දැයි හඳුන්වා ප්‍රධාන සමාජානුයෝජක කාරක මොනවා දැයි විමසන්න.

(ලකුණු 20 යි)

06. දේශපාලන පක්ෂය නිර්වචනය කොට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයන්හි දේශපාලන පක්ෂ වල කාර්ය භාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

07. නූතන දේශපාලන ක්‍රම තුළ බලපෑමේ කණ්ඩායම් වල කාර්ය භාරය හඳුන්වා දී ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයන් පවත්වා ගැනීමට ඒවා කොතරම් ප්‍රයෝජනවත් දැයි පෙන්වා දෙන්න.

(ලකුණු 20 යි)

08. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණ මොනවා ද? එම ක්‍රමයේ වාසි සහ අවාසි පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

09. අඩු දියුණු රාජ්‍යයන්හි "සංවර්ධනයේ දේශපාලනය" (Politics of Development) අවබෝධ කර ගැනීම සඳහා ඉදිරිපත් වී ඇති විවිධ ප්‍රවේශ මොනවා ද?

(ලකුණු 20 යි)

10. පහත සඳහන් ඕනෑම දෙකක් විභාග කරන්න.

(i) දේශපාලන සංවර්ධනය (Political Development)
(ii) දේශපාලන සංස්කෘතිය (Political Culture)
(iii) දේශපාලන සංනිවේදනය (Political Communication)
(iv) දේශපාලන සහභාගිත්වය (Political Participation)